**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**භූගෝල විද්‍යාව -I කොටස**
**10 ශ්‍රේණිය**
**I වාර පරීක්ෂණය - 2013** පැය 1 1/2

- **I කොටසේ සියලු ම ප්‍රශ්න ද II කොටසේ ඕනෑම ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.**
- **II කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

1. භෞම පද්ධතියේ ප්‍රධාන උප පද්ධති වන්නේ,
   (i) ශිලා ගෝලය, අයන ගෝලය, පරිවර්තී ගෝලය, ජෛව ගෝලය
   (ii) ජල ගෝලය, ශිලා ගෝලය, ප්‍රාවරණය, වායුගෝලය
   (iii) ශිලා ගෝලය, ජල ගෝලය, ජෛව ගෝලය, පරිවර්තී ගෝලය
   (iv) ශිලා ගෝලය, ජල ගෝලය, අයන ගෝලය, පරිවර්තී ගෝලය

2. වායුගෝලීය සංයුතිය පිළිබඳ නිවැරදි පිළිතුර කුමක්ද?
   (i) නයිට්‍රජන් 78.09%, ඔක්සිජන් 20.95%, කාබන්ඩයොක්සයිඩ් 0.3% වෙනත් වායූන් 0.93%
   (ii) නයිට්‍රජන් 78.09%, ඔක්සිජන් 20.95%, කාබන්ඩයොක්සයිඩ් 0.3%, වෙනත් වායූන් 0.93%
   (iii) නයිට්‍රජන් 78.10%, ඔක්සිජන් 20.4%, කාබන්ඩයොක්සයිඩ් 0.3%, වෙනත් වායූන් 0.91%
   (iv) නයිට්‍රජන් 78.09%, ඔක්සිජන් 20.4%, කාබන්ඩයොක්සයිඩ් 0.3%, වෙනත් වායූන් 0.91%

3. ඕසෝන් වායු ස්ථරය පිහිටා ඇත්තේ,
   (i) පරිවර්තී ගෝලයේය (ii) අපරිවර්තී ගෝලයේය
   (iii) මෙසෝ ගෝලයේය (iv) තාප ගෝලයේය

4. කිලෝමීටර් 50-80 දක්වා උස මට්ටමක පිහිටා ඇති වායුගෝලීය ස්ථරය වන්නේ කුමක්ද?
   (i) පරිවර්තී ගෝලය (ii) අපරිවර්තී ගෝලය
   (iii) මෙසෝ ගෝලය (iv) අයන ගෝලය

5. මිනිස් කටයුතු කෙරෙහි බලපාන සියළුම වායුගෝලීය සංසිද්ධි ඇතිවන කලාපය වන්නේ,
   (i) පරිවර්තී ගෝලය (ii) අපරිවර්තී ගෝලය
   (iii) ටෙසෝ ගෝලය (iv) ඕසෝන් ස්ථරය

6. පෘථිවියෙහි ශාක, සත්ව හා ක්ෂුද්‍ර ජීවීන් වාසය කරන්නා වූ ස්ථරය කුමක්ද?
   (i) ශිලා ගෝලය (ii) ජල ගෝලය (iii) වායුගෝලය (iv) ජෛව ගෝලය

7. ඕසෝන් ස්ථරය ක්ෂය වීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල නම්,
   (i) අම්ල වැසි හා චර්ම පිළිකා හටගැනීම (ii) භූමිකම්පා හා ගිම්හල් ඵල ඇතිවීම
   (iii) චර්ම පිළිකා හා ඇසේ සුද හටගැනීම (iv) නායයෑම් හා අම්ල වැසි හටගැනීම

8. ඇතැම් මුහුදු සාගරයේ ම කොටසක් වන අතර ම, තවත් ඒවා ගොඩබිමෙන් වට වූ මුහුදු වේ. පිළිවෙලින් නිවැරදි පිළිතුර තෝරන්න.
   (i) අරාබි මුහුද, කැස්පියන් මුහුද (ii) කැස්පියන් මුහුද, ඉන්දියන් සාගරය
   (iii) අරාබි මුහුද, කැරිබියන් මුහුද (iv) ජපන් මුහුද, කැරිබියන් මුහුද

9. මුහුදු ජල මට්ටම වැඩිවීමේ තර්ජනයට බලපාන සාර්ක් කලාපීය රටකි.
   (i) බංගලාදේශය (ii) පකිස්ථානය (iii) මාලදිවයින (iv) ඉන්දුනීසියාව

10. පෘථිවි ප්‍රාවරණයේ ඉහළ කොටසේ උෂ්ණත්වය,
(i) 5000°C (ii) 2000°C (iii) 1500°C (iv) 5600°C

11. පොළොව නිර්මාණය පිළිබඳව "තැටිභූකාරක කල්පිතය" ඉදිරිපත් කරන ලද්දේ,
(i) ඇල්ෆ්‍රඩ් වෙග්නර්ය (ii) ඩී.එම්. වාඩියාය
(iii) ආතර් හෝම්ස්ය (iv) තෝන්ත් වෙට්ය

12. අභිසරණ තැටි මායිමකදී පෘථිවි පෘෂ්ඨයේ පාෂාණ ස්ථර ගිලා බැසීමක් සිදුවන අතරම, එහිදී සිදුවන්නේ,
(i) තැටි දෙකක් එකිනෙකට ප්‍රතිවිරුද්ධව ගමන් කිරීමකි
(ii) තැටි දෙකක් මුහුණලා ගමන් කිරීමකි
(iii) තැටි දෙකක් එකිනෙකට ඇතිල්ලී ගමන් කිරීමකි
(iv) තැටි දෙකක් ඝට්ටනය වීමකි

13. යමකම ක්‍රියාවලිය ලෙස හැඳින්වෙන්නේ මින් කුමක්ද?
(i) පෘථිවි අභ්‍යන්තරයේ ඝනද්‍රව්‍ය, ද්‍රව මතුපිටට පැමිණ තැන්පත් වීමයි
(ii) පෘථිවියේ කබොල ආසන්නයේ සිට ඝනද්‍රව්‍ය මතුපිටට පැමිණ තැන්පත් වීමය
(iii) පෘථිවි ආසන්නයේ සිට ඝනද්‍රව්‍ය, ද්‍රව හෝ වායු සමඟ මිශ්‍ර වූ ද්‍රව්‍ය පෘථිවිය පෘෂ්ඨයට හා උපස්ථර වලට පැමිණ තැන්පත් වීමයි
(iv) තැටි මායිම් කලාපවල ගිනි කඳු ක්‍රියාකාරී වීමයි

14. කඳු නිර්මාණයට බලපාන හූ කාරකය වන්නේ,
(i) ආතතියයි (ii) සමපීඩනයයි (iii) විභේද වීමයි (iv) නායයාමයි

15. මොනැඩිනොක්ස් හූ ලක්ෂණයට නිදසුනක් වශයෙන් දැක්වේ.
(i) සමනළ කඳු (ii) රක්වාන බුළුතොට හෙල්
(iii) මිහින්තලය (iv) සබරගමු කඳු

- **අංක 16-25 දක්වා හිස්තැනට අදාළ වචනය නිවැරදිව ලියන්න.**

16. විසූවියස් ගින්කන්ද අයත් රට .............................................. ය වේ.
17. නිවර්තන වනාන්තරයක් ලෙස අප්‍රිකාවේ දක්නට ලැබෙන්නේ ...................................... ය.
18. රුසියාවේ කේතුධර වනාන්තර .................................. යනුවෙන් හැඳින්වේ.
19. කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයේ ඉංග්‍රීසි A අකුරෙන් දැක්වෙන්නේ ............................ වනාන්තරයන්ය.
20. සෞම්‍ය කලාපීය තෘණ භූමියක් වන ඩවුන්ස් පිහිටියේ .................................................. ය.
21. උල්පතකින් හටගන්නා යුරෝපීය රටක පිහිටි ගංහාවක් වන්නේ ............................ ගංහාවයි.
22. අර්ධ හෝ සම්පූර්ණ වශයෙන් උස්බිමක් වටවූ පෘථිවිය මතුපිට ඇති පහත් බිම් ප්‍රදේශ ........................................... ලෙස හැඳින්වේ.
23. උෂ්ණත්වය 0°C අඩු ස්ථර අයිස් තට්ටුවකින් වැසී ඇති මහද්වීපය වන්නේ .............................................. යි.
24. සමක ප්‍රදේශවල සිට ධ්‍රැවය දෙසට ගලන ජල ප්‍රවාහ .................................. දියවැල් ලෙස හැඳින්වේ.
25. ලොව උසින්ම පිහිටි මහද්වීපය වන්නේ ................................................ ය.

(ලකුණු 2x25=50)

**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**භූගෝල විද්‍යාව -II කොටස**
**10 ශ්‍රේණිය**
**I වාර පරීක්ෂණය - 2013**

(1) ලෝක ආකෘති සිතියමක ඇන්ඩීස් කඳු, ඉතියෝපියානු උස්බිම, වික්ටෝරියා විල, නයිල් ගංභාව, ටිබෙට් සානුව, නස්කා තැටිය, විසූවියස් ගින්කන්ද, සුමාත්‍රා දූපත, කුරෝසීවෝ ප්‍රවාහය, කැස්පියන් මුහුද යනාදිය ලකුණු කර නම් කරන්න. (ලකුණු 10)

(2) I) පෘථිවි සංයුතියේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2)
II) පෘථිවි ඝනත්වය හා ස්ථරවල සංයුතිය දැක්වෙන හරස් කඩක් ඇඳ, ඉන් එක් ස්ථරයක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 3)
III) භූතැටි කාරක කල්පිතයට අනුව පෘථිවියේ නිර්මාණය වී ඇති භූතැටි දෙකක් නම් කර, භූමිකම්පාවක් ඇතිවීමේදී එම තැටි ක්‍රියාත්මක වන ආකාරය දක්වන්න. (ලකුණු 5)

(3) I) පෘථිවියේ ජලය දක්නට ලැබෙන කොටස් වලින් දෙකක් දක්වන්න. (ලකුණු 2)
II) ජලයෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වා, භූගත ජලය භූගතව ඇති ආකාර අනුව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කොට පැහැදිලි කරන්න. (ලකුණු 3)
III) ජල චක්‍රයේ ක්‍රියාවලිය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කොට එහි වැදගත් අවස්ථා නම් කරන්න. (ලකුණු 5)

(4) I) යමකමය යන්න පැහැදිලි කොට, ගිනිකඳු නිර්මාණය වීමට එය බලපාන්නේ කෙසේ දැයි දක්වන්න. (ලකුණු 2)
II) යමහල් ක්‍රියාකාරීත්වයෙන් පරිසරයට සිදුවන බලපෑම් දෙකක් ලියන්න. (ලකුණු 3)
III) භූතැටි මායිම් ආශ්‍රිතව යමහල් ක්‍රියාත්මක වන ප්‍රධාන කලාප තුනක් නම් කර මානව කටයුතු කෙරෙහි යමහල් බලපාන ආකාරය නිදසුන් මගින් දක්වන්න. (ලකුණු 5)

(5) I) උෂ්ණත්වයේ පවතින වෙනස්කම් අනුව පෘථිවිය බෙදා ඇති දේශගුණ කලාප නම් කරන්න. (ලකුණු 2)
II) "A" වර්ගයේ උපදේශගුණ වර්ග දෙක නම් කොට, ඉන් එක් වර්ගයක විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 3)
III) නිවර්තන වර්ෂා වනාන්තරවල දැක්වෙන විශේෂ ලක්ෂණ පහක් ලියන්න. (ලකුණු 5)

(6) I) ලොව විශාලත්වයේ අනුපිළිවෙල අනුව මහාද්වීප හතරක් නම් කරන්න. (ලකුණු 2)
II) මුහුදු හා සාගර අතර පවතින වෙනස උදාහරණ එක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 3)
III) ජෛවගෝලයේ සීමාවන් දක්වා, එහි සමතුලිතතාවය බිඳ වැටීම කෙරෙහි මිනිසාගෙන් එල්ල වන අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ලකුණු 5)